# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2347/41 – 2023 සැප්තැම්බර් මස 02 වැනි සෙනසුරාදා – 2023.09.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2017/45.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.12.17 දිනැති හා අංක 2258/53 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.12.09 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, ඇල්හේන පාර, ජයසුන්දර පෙදෙස, අංක 10/21ඒ හි පිහිටි සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 74/2021 හා 2023.08.02 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

*ජී. පී. ගුණතිස්ස වෙනුවෙන්,*
සමස්ථ ලංකා මෝටර් සේවක සමිතිය,
10/21ඒ, ජයසුන්දර පෙදෙස,
ඇල්හේන පාර,
මහරගම.

*ඉල්ලුම්කරු*

නඩු අංකය - A74/2021.
IR/COM/05/2017/45.

එදිරිව:

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

*වගඋත්තරකරු*

වර්ෂ 2023 ක් වූ අගෝස්තු මස 02 දින දී ය.

**(1) බේරුම්කරු පත් කිරීම:**

ඉහත බේරුම්කරණයට අදාළව කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධන මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව මෙම ආරාවුල බේරුම් කිරීම සඳහා බේරුම්කරු 2021 දෙසැම්බර් මස 09 වැනි දින පත් කරන ලදී.

**(2) කාර්මික ආරාවුල:**

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ අවිස්සාවේල්ල ඩිපෝවේ ආරක්ෂක පරීක්ෂක වශයෙන් සේවය කළ ජී. පී. ගුණතිස්ස මහතාට ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් 2017 මැයි 05 වැනි දින ලබා දුන් විනය නියෝගය මගින් අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නත් අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට කුමන සහනයක් හිමිව තිබේ ද? යන්නත් පිළිබඳව වේ. "

**(3) සාක්ෂි සහ නීතිමය පසුබිම:**

මෙම බේරුම්කරණයේ දී ඉල්ලුම්කරු දිවුරුම් ප්‍රකාශයක් සමග A1 - A6 දක්වා ලේඛන ගොනු කරන ලදී. එකී ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දී වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් R1 - R13 දක්වා ලේඛන ලකුණු කරන ලදී.

ඉල්ලුම්කරුගෙන් නැවත ප්‍රශ්න ඇසීමක් සිදු නොකරන ලද අතර මෙම පරීක්ෂණය පුරාවට වගඋත්තරකරු වෙනුවෙන් R 26 දක්වා ලේඛන ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී. ඉල්ලුම්කරු සිය තනතුර ස්ථිර වූ දින සිට වසර 17ක සේවා කාලයක් හෙබ වූ නිලධාරියෙකි. එකී පූර්වාදර්ශයෙ හි ඉල්ලුම්කරුට ද ආයතන නීති රීති හා පරිචයන් පිළිබඳව නිසි දැනුමක් තිබූ බවට උපකල්පනය කළ යුතුය. එසේම ආයතනික විනය ව්‍යවස්ථාමාලාව ගැන ද ඉල්ලුම්කරුට නිසි දැනීමක් තිබුණු බවත් පිළිගෙන ඇත. ඉල්ලුම්කරු ආයතනික ව්‍යවස්ථා මාලාවේ 4 වන වගන්තිය යටතේ බරපතල විශමාචාරයක්වන මත්පැන් පානය කර සිටීම ද සිය සාක්ෂියේ දී පිළිගෙන ඇත. එකී කාරණා සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ හබයක් නොමැති බැවින් අනෙකුත් ලේඛන සහ සාක්ෂි වැඩිදුරටත් සළකා බලන ලදී.

ඉල්ලුම්කරුට අදළව සේවකයෙකුට R7 විනය ව්‍යවස්ථාමාලාව අනුව දඬුවම් පමුණුවනු ලැබූ විටක අභියාචනය කිරීමට ඇති අයිතිය අදාළ ව්‍යවස්ථාවේ 12 වගන්තියෙන් පිළිගෙන ඇති අතර එකී අභියාචනා කාර්ය පටිපාටිය පිළිබඳ විධිවිධාන 12 (1), 12 (2), 12 (3), 13, 14, 15, 16 සහ 17 ජේදයන් හි වඩාත් අර්ථ ගන්වා ඉදිරිපත් කර ඇත.

මෙම ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ අසන අවස්ථාවේ දී (2023.01.11 පිටුව 94 හි) ඉල්ලුම්කරුගෙන් තමාට ලැබුණු නියෝගයට එරෙහිව අභියාචනයක් නොකලේ ද යන්න පිළිබඳ ප්‍රශ්න නගා ඇති අතර ඒ සම්බන්ධයෙන් ඉල්ලුම්කරු තමාට මතකයක් නොමැති බව පැවසුව ද අභියාචනයක් පැවැත්වූයේ නම් එයට අදාළ ලේඛන හෝ සාක්ෂි කිසිවක් මෙම බේරුම්කරණය හමුවට ඉදිරිපත් කර නැත.

තව ද, එකී පදනම මත මෙම ඉල්ලුම්කරුට ලැබුණු දඬුවම "එකම චෝදනා පත්‍ර සහිත එකට සේවය තහනම් කරන ලද එකම විනය විභාගයේ සිටි විත්තිකරුවන් තිදෙනෙකුට අසමාන ලෙස සලකා ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ විනය නීතිවලට පටහැනිව කටයුතු කර මෙම ඉල්ලුම්කරුට අදාළ වැටුප අහිමි කිරීමක් සිදු කර ඇත් ද යන්න සලකා බැලිය යුතුය."

බේරුම්කරණ පරීක්ෂණයේ දී R 10, R 11, R,13 ලෙස මෙම ඉල්ලුම්කරුට සහ ආර්. එච්. ධනපාල නැමැත්තෙකුට එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනා පත්‍රයන් දෙකක් සාක්ෂි ලෙස ඉදිරිපත් කරන ලදී. එකී චෝදනා පත්‍ර දෙකෙ හි ඉදිරිපත් වී ඇති චෝදනා සම්බන්ධයෙන් මෙම තීන්දුවේ මතුවට කරුණු දක්වා ඇත.

R II ලේඛනය අනුව මෙම ඉල්ලුම්කරුට විනය නියෝගය ප්‍රකාරව දින 7 ක වේතන දඩ නියම කිරීමත් නැවත මෙවැනි විශමාචාරයකට වරදකරු වුවහොත් සේවයෙන් පහ කරන බවටත් තරයේ අවවාද කර ඇත.

වගඋත්තරකාර ආයතන වෙනුවෙන් සාක්ෂි සඳහා කැඳ වූ ඕමන්තගේ ගයාන් ධර්මකුමාර පෙරේරා යන අය 2023.03.30 සාක්ෂි ලබා දෙමින් (නඩු ගොනුව 125) පහත ආකාරයට සාක්ෂි ලබා දී ඇත.

ප්‍රඃ ධනපාලට එරෙහිව විනය විභාගය නතර කරලා තියෙනවා, ඉතිරි දෙදෙනාට විනය විභාග පවත්වලා තියනවා ද?

පිඃ දිගටම කරලා තියෙනවා.

ප්‍රඃ විනය විභාගයේ නිගමනය මොකක් ද?

පිඃ නියෝගයක් ලබා දීලා තියනවා.

ප්‍රඃ කවුද නියෝගය ලබා දීලා තියෙන්නේ?

පිඃ ජ්‍යෙෂ්ඨ විනය නිලධාරී

ප්‍රඃ මොකක් ද නියෝගය?

පිඃ අදාළ ඉල්ලුම්කරුවන ජී. පී. ගුණතිස්ස යන අයටයි වසන්ත ලාල් යන අයටයි දින 07 ක වේතන දඩ නියම කිරීම. නැවත මෙවැනි වැරදිවලට වරදකරු වුවහොත් සේවයෙන් පහ කරන බවට.

ඉහත සාක්ෂිය හරස් ප්‍රශ්නවලදී ද අභියෝගයට ලක් වී නොමැති අතර ඉන් පරිබාහිරව ලබාදුන් නියෝගයේ සහ/ හෝ නියෝගයන් හි අසමානතාවයක් වූයේ නම් එකී අසමානතාවය පිළිබඳ සාක්ෂි කිසිවක් මෙම බේරුම්කරණයට ඉදිරිපත් කර නැත. අවම වශයෙන් කිසිදු ලේඛනයක් හෝ ඒ පිළිබඳව වටහාගත හැකි ලේඛනයක් හෝ ඉදිරිපත් කර නොමැති අතර ඒ අනුව එකී ගයාන් ධර්මකුමාර පෙරේරාගේ සාක්ෂිය පමණක් මෙහි දී ඉස්මතුව පෙනේ. මක් නිසාද යත් ඉල්ලුම්කාර පාර්ශ්වය එකී සාක්ෂිකරු ඉහත ලබා දුන් සාක්ෂිය හබ කිරීමට අසමත් වීම නිසාය.

ඉල්ලුම්කාර පාර්ශ්වය ''A6'' වශයෙන් ලකුණු කරන ලද නිත්‍ය උපදෙස් (විනය) සම්බන්ධ (1997 අංක 1 දරන) ලේඛනයේ 31 වගන්තිය අනුව ''දඬුවම් පැමිණවීමේ දී සමානත්වයක් තිබිය යුතුය. වරද කළ හෝ කරනු ලැබූ අවස්ථාවක දී පසුබිම වූදිත සේවකයාගේ පූර්ව චර්යා අනුව දඬුවම සැහෙන ප්‍රමාණයකින් වෙනස් කළ හැක" යනුවෙන් දක්වා ඇත.

නඩු ගොනුවේ සාක්ෂි සටහන් අනුව 100 වන පිටුවේ එනම් 2023.01.11 දින කාර්ය සටහන්වල 19 පිටුවේ ඉල්ලුම්කරු පහත ලෙස සාක්ෂි දී ඇත.

ප්‍රඃ ඔබගේ දිවුරුම් ප්‍රකාශයේ 12 වන ඡේදය කියවන්න,
(පිළිතුර කියවා සිටී.)

ප්‍රඃ 12 වන ඡේදයේ කියන අනිකුත් විත්තිකරුවන් කවුද?

පිඃ රෝමන් ධනපාල, ඊරියගම

ප්‍රඃ දෙන්නෙක් හිටියා මතක ද?

පිඃ ඔව්

ප්‍රඃ ඔවුන් දැරූ තනතුරු මොනවා ද?

පිඃ කාර්මික, වැඩමූලික

ප්‍රඃ එම තනතුරු දෙක ඔබ දැරූ තනතුරට සමාන ද?

පිඃ සමාන නෑ.

එම පිටුවේ වැඩිදුරටත්

ප්‍රඃ එකටද බිව්වේ තුන්දෙනා

පිඃ එකට බිව්වේ නෑ

ප්‍රඃ එකම වෙලාවේ ද බිව්වේ

පිඃ ඒකනම් දන්නේ නෑ

ප්‍රඃ එකම තැන සිට ද බිව්වේ

පිඃ නෑ

යනුවෙන් සාක්ෂි ලබා දී ඇත.

තව ද, එකී ධනපාල නැමැත්තාට ඉදිරිපත් කරන ලද 1 වන චෝදනාව වන්නේ "2016.09.24 දින රාත්‍රී 23.20 පැයට හෝ ඊට ආසන්න වෙලාවක රාජකාරී කාලය තුළ මත්පැන් පානය කර හෝ මුවින් මත්පැන් ගඳ වහනය වෙමින් ඉංජිනේරු මහතුන්ගේ සේවක විවේකාගාරයේ ඇඳක් මත ඇලවී සිටීමෙන් බරපතල විශමාචාරයක් සිදු කර ඇත්තේය" යන්නය.

මෙම ඉල්ලුම්කරු සම්බන්ධයෙන් නගා ඇති 1 වන චෝදනාව වන්නේ "2016.09.24 හෝ ඊට ආසන්න දිනක රාජකාරී වෙලාව තුළ මුවින් මත්පැන් ගඳ වහනය වෙමින් මණ්ඩලීය භූමි භාගයක් තුළ රැඳී සිටීමෙන් බරපතල විශමාචාරයක් සිදු කර ඇත්තේය" යන්නය.

මෙම චෝදනා සහ අවස්ථා සම්බන්ධය සලකා බලන විට එකම ස්ථානයේ සිදු නොවූ එකම තනතුර නොදැරූ ස්ථාන දෙකක සිදු වූ ක්‍රියාවලියක් බව පැහැදිලි වේ. තව ද, සාක්ෂි සලකා බැලීමේ දී මෙම ඉල්ලුම්කරුට ලබාදී ඇති දැඬුවම සාපේක්ෂව සානුකම්පිතව සලකා බලා ලබා දී ඇති දඬුවමක් බව ද පෙනී යයි.

තව ද, සිය සේවක අයිතීන් සම්බන්ධයෙන් අභියාචනයක් කළ හැකි බව දැන දැනම ඉල්ලුම්කරු ඒ සම්බන්ධව නිහඬ පිළිවෙතක් අනුගමනය කර ඇති බව ද පෙනී යයි. මෙම කරුණු සමස්ථයක් වශයෙන් සලකා පහත සඳහන් පරිදි තීන්දුවක් ලබා දෙමි.

**(4) තීන්දුව:**

යම් පාර්ශ්වයක් මෙම බේරුම්කරණය හමුවේ යම් කාරණයක් පවතින බවට හෝ පිළිගත යුතු බවට කියා සිටින්නේ නම් එකී කාරණය ඔප්පු කිරීමේ භාරය පැවරෙන්නේ අදාළ කරුණෙහි පැවැත්ම සම්බන්ධයෙන් විශ්වාසය දැරිය යුතු බවට කියා සිටින පාර්ශ්වය විසිනි. ඒ අනුව යම් හෙයකින් සමාන චෝදනාවන්ට ලබා දුන් දඬුවම් දෙයාකාරයකින් හිමිවේ නම් ඒ පිළිබඳ සලකා බැලීමට අදාළ ලේඛන මෙම බේරුම්කරණය හමුවට ඉදිරිපත් විය යුතුය. කෙසේ වෙතත් එවැනි ලේඛන කිසිවක් නොමැති බැවින් සහ සාක්ෂ්‍යතා වැඩිබර සම්භාවිතාවය වගඋත්තරකාර පාර්ශ්වයට වාසි සහගත බැවින් ඊට අදාළව ඉදිරිපත් වූ එකම සාක්ෂිය වගඋත්තරකරුගෙන් ඉදිරිපත් වූ බැවින් ඉල්ලුම්කරු ඉල්ලා සිටි කරුණු කිසිවක් මෙම බේරුම්කරණය හමුවේ නිසි සාක්ෂි සහිතව ඉදිරිපත් වී නොමැති බවට තීරණය කරමි. ඒ අනුව ඉල්ලුම්කරුගේ ඉල්ලුම් පත්‍රය නිශ්ප්‍රභ කරමි. ඉල්ලුම්කරුට සහන කිසිවක් හිමි නොවේ.

නීතිඥ බිනර ඒ. ගුණසේකර,
බේරුම්කරු.

EOG 09 - 0010

---

*මගේ අංකය*: IR/COM/02/2018/77.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.09.17 දිනැති හා අංක 2141/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.08.26 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහනුවර, ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවත, අංක 481/1 හි පදිංචි පී.ඩී.පී. ගෝමස් මිය සහ කොළඹ 02, නවම් මාවත, අංක 40, තැ.පෙ. 1852 පිහිටි ජාතික සංවර්ධන බැංකුව පීඑල්සී අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම

සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 96/2019 හා 2023.07.24 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 අගෝස්තු මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

නඩු අංකය : A/96/2019.
යොමු අංකය: IR/COM/02/2018/77.

පී. ඩී. පී. ගෝමස්,
481/1, ශ්‍රීමත් කුඩා රත්වත්ත මාවත,
මහනුවර.

*පළමු පාර්ශ්වය*

**සහ**
ජාතික සංවර්ධන බැංකුව,
පී.එල්.සී තැ.පෙ. 1852,
නො.40, නවම් මාවත,
කොළඹ 02.

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත් සමග කියවා දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අනපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.08.26 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

**ආරාවුලට තුඩු දුන් කාරණය:**

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික අරාවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ඒ.විමලවීර මහතා විසින් 2019.08.22 වන දිනැති එවා ඇති ලිපියේ දැක්වෙන්නේ,

ජාතික සංවර්ධන බැංකුව පී.එල්.සී, ආයතනයේ 1998.03.16 සිට 2016.03.16 දින දක්වා සේවය කරන ලද පී.ඩී.පී ගෝමස් මිය, ආබාධිත විශ්‍රාම වැටුපක් ලැබීමට සුදුසුකම් නොලබන බව ජාතික සංවර්ධන බැංකුව පී.එල්.සී, ආයතනය විසින් තීරණය කිරීම නිසා ඇයට අසාධාරණයක් සිදුවී ද? එසේ නම් ඇයට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.

**පාර්ශවයන්ගේ ප්‍රකාශයන්:**

ඉල්ලුම්කාර පාර්ශ්වය විසින් තම පළමු ප්‍රකාශය 2019.10.18 දින පැ.1 සිට පැ.14 දක්වා ලේඛන සමග ඉදිරිපත් කර ඇති අතර වග උත්තරකාර පාර්ශ්වය ද, 2019.10.23 දින ඉදිරිපත් කර ඇත. ඉල්ලුම්කාරිය වග උත්තරකරුගේ උත්තරය සම්බන්ධයෙන් සිය ප්‍රති පිළිතුරු ප්‍රකාශය 2019.12.12 දින ඉදිරිපත් කර ඇත. ඉන්පසු වග උත්තරකාර පාර්ශ්වය ද සිය දෙවන ප්‍රකාශය ඉදිරිපත් කරමින් ඉල්ලුම්කාරිය ආබාධිත විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන බව සඳහන් කරමින් ඊට හේතු දක්වා ඇත.

**පසුබිම සහ නඩු කාර්ය පරිපාටිය:**

මෙම නඩුව විභාගයට ගැනීමට පෙර ඉහත කී පරිදි දෙපාර්ශවයේම ප්‍රකාශන සහ ප්‍රති පිළිතුරු සැලකිරීම් කැඳවා ඇති අතර පසුව සමථයකට ඉඩකඩ ඇත්දැයි විමසා බැලීමෙන් පසු දෙපාර්ශවය අතර සමථයක් නොවූයෙන් නඩුව විභාගයට ගෙන ඇත.

කෙසේ වුව ද ඉල්ලුම්කාරිය ආබාධිත තත්වයෙන් සිටි බැවින් ඇයට කොළඹ පිහිටි කාර්මික අධිකරණයට පැමිණීමට නොහැකි බව 2020.03.17 ලිපියක් මගින් දන්වා ඇති අතර ඒ අනුව ඇයගේ ඉල්ලීම සලකා බලා මෙම නඩුව මහනුවර පිහිටුවා ඇති කාර්මික අධිකරණය වෙත යොමුකර ඇත.

රටේ පැවති ‘covid’ වසංගත තත්වය හේතුවෙන් නඩුව විභාගයට ගැනීම මාස ගණනාවකින් ප්‍රමාද වූ අතර, 2020.09.02 නඩු විභාගය සඳහා දෙපාර්ශවය කැඳ වූ අතර එහි දී දෙපාර්ශවය විසින්ම සමථයක් ඇති කර ගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් කරුණු දක්වන ලද අතර සමථය හෝ විභාගය සඳහා නඩුව 2020.11.02 දින සහ 2021.02.15 දිනට නියම කරණු ලැබුව ද වග උත්තරකාර පාර්ශවය යම් යම් හේතු දක්වා එකී දිනයන් හි නොපැමිණි අතර ඉල්ලුම්කාරියගේ අසනීප තත්වය සලකා බලා ඇයගේ සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මගින් ලබා ගැනීමට ඉල්ලුම්කාර පාර්ශවය අවසර ඉල්ලා සිටින ලදී. ඒ අනුව දිවුරුම් ප්‍රකාශයක් මගින් ඉල්ලුම්කාරියගේ සාක්ෂිය 2021 මාර්තු මස 25 වන දින ඉදිරිපත් කරන ලදී. එහි දී දෙපාර්ශවය අතර සමථයක් තිබේ ද යන්න විමසා සිටි අතර සමථයක් නොවුයෙන් ඉල්ලුම්කාරියගේ සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මත ලබාගෙන ඇති හෙයින් ද වග උත්තරකාර පාර්ශවයෙන් හරස් ප්‍රශ්න විමසීම එදිනම ආරම්භ කරන ලදී.

රටේ වසංගත තත්වය සහ අර්බුදකාරී තත්වයන් හේතුවෙන් සහ වග උත්තරකරුවන් විසින් යම් යම් හේතු දක්වා නොපැමිණීම හේතුවෙන් නඩුව විභාගයට ගැනීම ප්‍රමාද වූ අතර 2022.01.18 දින වග උත්තරකාර පාර්ශවය විසින් ඉල්ලුම්කාර පාර්ශවයේ සාක්ෂි කාරියගෙන් වැඩිදුර හරස් ප්‍රශ්න විමසීම සිදුවිය. 2022.04.06 දින නැවත ප්‍රශ්න විමසීම සිදුකරණ ලදී. කෙසේ වුවද එදින අවසාන වශයෙන් ඉල්ලුම්කාර පාර්ශවය විසින් නැවත සමථ යෝජනාවක් ලෙස ආබාධිත තැනැත්තියගේ අබාධිත තත්වය සලකා බලා ඇයට විශ්‍රාම වැටුපක් ලබා දෙන ලෙසත්, ඇය වෙත දැනට ගෙවා ඇති ආබාධිත මුල්‍යමය සහනය වන රුː1,144,171.00 අබාධිත විශ්‍රාම වැටුපක් ලෙස සළකා විශ්‍රාම වැටුපක් ලෙස අඩුකර ගන්නා ලෙසත් අවසාන වශයෙන් ඉල්ලීමක් කරන ලදී. ඒ අනුව මෙම සමථ යෝජනාව සළකා බලා නඩුව සමථයකට පත්කර ගැනීමට වග උත්තරකාර පාර්ශවය ද එකඟතාවය පළකළ අතර එකී යෝජනාව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කිරීම අවශ්‍ය බව ද ප්‍රකාශ කරන ලදී. කෙසේ වුව ද එකී ඉල්ලීම බේරුම්කරණයට පිටපතක් ද සමග වග උත්තරකාර පාර්ශවයට යොමු කරන මෙන් අධිකරණය මගින් ඉල්ලුම්කරුට දැන්වූ අතර, ඒ අනුව සමථය සලකා බැලීමට මෙම නඩුව සඳහා ඉදිරි දිනයක් ලබාදෙන ලදී.

2023.02.14 දින සමථ යෝජනාව සලකා බැලීම පිණිස දෙපාර්ශවය නැවත කැඳවන ලදී. එහිදී පළමු පාර්ශවය විසින් 2022.12.20 දක්වා ඉල්ලා ඇති හිග විශ්‍රාම වැටුප් මුදල වන තිස්ලක්ෂ පනස් හය දහස් හාරසිය අසූ නවයක මුදලින් (රුː 3,056,489.00 ) ක මුදලින් ආයතනය වෙත අඩුවිය යුතු සේවය අවසන් කිරීම වෙනුවෙන් ලාබාදී ඇති මුදල් සහ ඊට සම්බන්ධව ගෙවා ඇති ආදායම් බදු යනාදී මුදල් අඩුකර විසිතුන් ලක්ෂ හැට හත් දහසක මුදලක් (රු. 2,367,235.00) පළමු පාර්ශවයට ගෙවීමට හැකියාව ඇති බව වග උත්තරකාර පාර්ශවය ප්‍රකාශ කරන ලදී. තව ද ඉන්පසු විශ්‍රාම වැටුපක් ලෙස මසකට රු. 51,860 ක මුදලක් ගෙවීමට හැකියාව ඇති බව ද ප්‍රකාශ කරන ලදී. එකී යෝජනාවට පළමු පාර්ශවය එකඟ වූ අතර, පළමු පාර්ශවය වැඩි දුරටත් ඉල්ලා සිටියේ 2023 ජනවාරි සිට එකී විශ්‍රාම වැටුප ගෙවන ලෙසය. කෙසේ වුව ද මේ පිළිබඳව ඉහල කළමනාකාරීත්වය සමග සාකච්ජා කළ යුතු බව ද තීරණය විය.

2023.05.22 දින සමථය සම්බන්ධයෙන් නැවත සළකා බැලීමට කැඳවූ අතර එහිදී

**පූර්ණ සහ අවසාන සමථයක් වශයෙන්:**

1. ඉල්ලුම්කාරිය මුල් අවස්ථාවේ ඉල්ලා සිටි මුදලින් ස්වෙච්ඡාවෙන් විශ්‍රාම යැවීමේ පිළිවෙත අනුව ලබාදුන් මුදල් අඩුකර සහ 2023.01.01 සිට 2023.05.31 දක්වා වූ විශ්‍රාම වැටුප වශයෙන් රු. 259,300.00 ක මුදලක් ද එකතුකොට මුළු මුදල වශයෙන් රු ː 2,626,535.00 ක මුදලක් පළමු පාර්ශවයට ගෙවීමටත් එකී මුදල ඉල්ලුම්කාරියට චෙක්පතකින් ලබාදීමටත් දෙවන පාර්ශ්වය එකඟ විය.

2. තව ද දෙවන පාර්ශවයේ චක්‍ර ලේඛනයක් වන 1991 මැයි 23 දිනැති 21/91 චක්‍රලේඛනය අනුව පළමු පාර්ශ්වයට රු. 51,860.00 ක් බැගින් 2023.06.01 දින සිට විශ්‍රාම වැටුප් ගෙවීමට ද දෙවන පාර්ශ්වය එකඟ විය.

3. තව ද විශ්‍රාම වැටුප් සම්බන්ධයෙන් ලේඛන අත්සන් කිරීම මහනුවර දී සිදු කිරීමට ඉල්ලුම්කාර පාර්ශ්වය ඉල්ලා සිටි අතර එසේ කිරීමට හැකියාවක් ඇත්නම් ඒ පිළිබඳව සළකා බැලීමටත් එසේ නොහැකි වුවහොත් පළමු පාර්ශ්වයට ඒ සඳහා කොළඹ ප්‍රධාන ශාඛාව මගින් කටයුතු කළ හැකි බවටත් වැඩි දුරටත් දෙවන පාර්ශ්වය විසින් දන්වන ලදී. මේ අනුව දෙවන පාර්ශ්වය ඉහත කී පරිදි සිදු කළ සමථ යෝජනාවන්ට පළමු පාර්ශ්වය එකඟ වූ අතර, ඒ අනුව පැමිණිල්ල සමථයකට පත්විය.

**ප්‍රදානය:**

1. ඉහත කී සමථ එකඟතාවයන්ට අනුව කටයුතු කරන මෙන් වග උත්තරකාර පාර්ශ්වය වන දෙවන පාර්ශ්වයට නියෝග කරමි.

2. එකී සමථ කොන්දෙසි අනුව ඉදිරි කටයුතු සිදුවන්නේ ද යන්න සළකා බැලීමට මෙම ප්‍රදානය මහනුවර දකුණ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට යොමුවිය යුතු බව තීරණය කරමි.

3. මෙය සාධාරණ සහ යුක්ති සහගත ප්‍රදානයක් බව තීරණය කරමි.

**එච්.එම්. අනුලාවතී,**
බේරුම්කරු.

2023 ජූලි මස 24 වැනි දින.

EOG 09 - 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.